ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2020

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාචනය කළ මතය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්ගේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වත්කමක ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය සමාලෝචනය කළ යුතු අතර එම ඵලදායි ජීව කාලය සහ සුන්බුන් අගය සම්බන්ධ අපේක්ෂිතයන් පසුගිය වර්ෂයට වඩා වෙනස් වන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්කම් සහ වැරදි සම්බන්ධ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. එහෙත් පිරිවැය රු.මිලියන 348.79 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දැනට භාවිතා කරමින් පවතින වත්කම් සම්බන්ධයෙන් ඒ පරිදි කටයුතු කර නොතිබුණි.	මෙම වත්කම්වල අවශේෂ හා ඵලදායී ජීව කාලය නැවත තක්සේරු ලබාගැනිම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව සඳහා තක්සේරු නිලධාරින් තෝරා පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. එම ක්‍රියාවලිය සිදුවීමෙන් අනතුරුව අදාළ තක්සේරු අගයන් ගිණුම් වලට ගැනිමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 55 ඡේදය ප්‍රකාරව හා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.2.3 ප්‍රකාරව වත්කම් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2020 වර්ෂය තුළදී වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද රු.5,609,889 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නොසලකා සමාලෝචිත වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි.	ප්‍රධාන කාර්යාලයේ 2020 හා 2021 වර්ෂවල මිලදි ගත් දිනයේ සිට වත්කම් ක්ෂය කිරිම 2022 වර්ෂයේදි නිවැරදි කර ඇති අතර, 2022 වර්ෂයේ මිලදි ගත් දිනයේ සිට නිවැරදිව ක්ෂය කිරිම සිදුකර ඇත.වතු අංශයද 2021 වර්ෂයේ සිට නිවැරදිව මිලදි ගත් දිනයේ සිට ක්ෂය කිරිම සිදුකර ඇත.	ගිණුම් ප්‍රමිත හා මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය එනම් අස්ථිත්වයේ වර්තමාන සේවා පිරිවැය, සේවකයින්ගේ වයස් ප්‍රමාණය, සේවකයින්ගේ ආයු අපේක්ෂණය, සේවා පිරිවැටුමට වූ බලපෑම, විශ්‍රාම වයස, වට්ටම් අනුපාතය, වැටුප් හා වර්ධන ප්‍රතිශතය යොදා ගත යුතු වුවත්, මණ්ඩලය විසින් සිය ප්‍රතිලාභ ගණනයේදී සේවකයකුගේ වර්ෂ අවසානයේ ලබන මූලික වැටුප පමණක් පදනම් කරගෙන සේවා ප්‍රතිලාභ ගණනය කර තිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පාරිතෝෂික ගණනය කිරිම පෙර සිටම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පාරිතෝෂික හිඟ ගෙවීම් සම්බන්ධව කටයුතු සිදුකරනු ලබන්නේ මෙම පනතට අනුව බවද සඳහන් කරමි. 2024.06.25 දින පැවති විගණන කළමනාකරන කමිටුවේදි පාරිතෝෂික පනතට අනුව කටයුතු කිරිම නිවැරදි බව නිර්දේශ කර ඇත. තවද 2020 මූල්‍ය ප්‍රකාශනයන් මගින් මේ සම්බන්ධ හෙළිදරව් කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සේවා ප්‍රතිලාභ ගණනය කල යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මූලිකව හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවද මණ්ඩලය විසින් රු.33,620,787 ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම එලෙස වාර්ෂිකව තක්සේරු නොකර ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. එසේම එම අගය සත්‍යාපනය කර ගැනීම සඳහා ද වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ගස් සංගණන හා තක්සේරු වාර්තාද විගණනයට ඉදිරිපත් නොවීය. සමාලෝචිත වර්ෂයේදී විකුණූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල විකුණුම් ආදායම රු.47,606,468 ක් වුවද මෙම ගස්වලට අදාල පිරිවැය වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරිම සඳහා ඉක්මනින් ලබාදිය යුතු බැවින් 2020 වර්ෂයේදි මෙම ජීව විද්‍යාත්මක වත්කම්වල තක්සේරු වටිනාකම් ගිණුම් වලට ගැලපිමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින් 2020 වර්ෂයේ ගිණුම් වලට මෙය ඇතුළත් කිරිමට නොහැකි විය. එබැවින් 2021 වර්ෂයේ ගිණුම් වලට මෙම ගැලපිම් සිදුකිරිමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ වටිනාකමට හඳුනා ගැනීමට හා වත්කම්වල විකුණුම් වලට අදාල පිරිවැය වත්කම් වලින් ඉවත් කල යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 54 (ඇ) ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ක්ෂය කරන ක්‍රමය සහ ක්ෂය අනුපාත මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඒ අනුව ක්ෂය ගිණුම්ගත කළ යුතු වුවද රු.1,835,941 ක අනෙකුත් ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාලව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණු අතර ක්ෂය ගණනය කර ගිණුම්ගත කිරීමද සිදුකර නොතිබුණි.	ක්ෂය ක්‍රමය හා ක්ෂය අනුපාතය හෙළිදරවු කර තිබූ රු.6,489,530 තුළ ඇති රු.1,928,369 ක් වන කොකෝවා 2020 වර්ෂයේදි ක්ෂය කිරිම සිදුකර ඇති අතර, කුරුඳු, ගම්මිරිස් හා අඹ වගාව 2022 වර්ෂයේ සිට ක්ෂය කිරිමට කටයුතු කරනු ඇත. එමෙන්ම මණ්ඩලයේ වතුයායන් තුළ පවතින අනෙකුත් ජීව විද්‍යාත්මක වත්කම් රු.1,835,941 ක් වු වගාව ඇතුළත කරාබු නැට් 1,182,161 හා කෝපි වගාව රු.653,780 ක් ඇතුළත් වන අතර, එම වගාවන් වල ක්ෂය	ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ක්ෂය කරන ක්‍රමය සහ ක්ෂය අනුපාත මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඒ අනුව ක්ෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

		අනුපාත හා පරිනත වන කාලය 2022 වර්ෂයේ ගිණුම් සටහන් තුළින් හෙළිදරවු කිරිමට කටයුතු කරනු ඇත.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් බදු පදනම මත ලබා දී ඇති හෙක්ටයාර 123,306.37 ක් ඇතුළත්ව මණ්ඩලය සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 142,593.03 ක් වුවත් මෙම ඉඩම්වල වටිනාකම තක්සේරු කර 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ආයෝජිත දේපල යටතේ සහ දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර හෙක්ටයාර 2,872.45 ක ඉඩම් මණ්ඩලය විසින් නිශ්චිතව හඳුනාගෙනද නොතිබුණි. මේ අනුව මණ්ඩලය සතු ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මඟින් පිළිඹිබු නොවන අතර එම ඉඩම් වල නිවැරදිතාවය හා සමස්ථ වටිනාකම පිළිබඳ විගණනයට තහවුරු කර ගැනීමටද නොහැකි විය.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු වතු මැනුම් කටයුතු කිරිම සඳහා අමාත්‍යාංශය මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර, දැනට එම වතු මැනුම් සිදුකර අවසන් කර ඇති බවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. නමුත් එම වතුවලට අදාළ පිඹුරුපත් තවමත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලැබී නොමැති අතර, එම පිඹුරුපත් ලැබිමෙන් අනතුරුව තක්සේරු අගය ලබාගැනිමට කටයුතු කරන බව ඉඩම් අංශයෙන් අප වෙත වාචිකව දැනුම් දී ඇත. මැනුම් ආයතන සතු ඉඩම් මැනුම් කර තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළින් ඉදිරියේදි හෙළිදරව් කිරිමට කටයුතු කරනු ඇත.	මණ්ඩලය සතු මුළු ඉඩම්වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව ගිණුම්ගත කිරීම හා හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කල යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට පෙර වර්ෂයන්ට අදාලව සිදුකළ ගැලපීම් නිසා සිදුවූ බලපෑම ලෙස රු.27,155,018 ක වටිනාකමකින් මුදල් ප්‍රවාහයට ගැලපීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම වටිනාකම තුළින් මෙම වර්ෂයේ ලාභයට කිසිදු බලපෑමක් සිදුවී නොමැති බැවින්, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයේ අවාසිදායක ශේෂය තවදුරටත් මෙම වටිනාකමින් වැඩිවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.	පසුගිය වර්ෂවල ලාභයට බලපාන ලද වැරදි නිවැරදි කර ගැලපීම් සිදුකර ඇති අතර රු.27,155,018 ක ශේෂය පෙර වර්ෂවල ගැලපීම් ගිණුමේ තොරතුරු වලින් ලබාගත හැකිය. මෙම ගිණුමට අදාළ ජර්නල් වවුචර් 2020 ජර්නල් වවුචර් ගොනුවල අඩංගු කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2007 වර්ෂයේදී නාගස්තැන්න වතුයාය දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගමකට ලබාදීමෙන් පසු එම ආයතනයෙන් අය විය යුතු රු.2,176,683 ක් වර්ෂ 12 කට වැඩි කාලයක සිට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ලෙස	නාගස්තැන්න වතුයාය Queenrich Agro Pvt Ltd; ආයතනය වෙත 2007 වර්ෂයේදි දිර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇත. ඉඩම් අංශයෙන් ලද තොරතුරුවලට අනුව Queenrich Agro සමාගම හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය එකග වූ පරිදි	ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂය සනාථ කර ගෙන නිවැරදි වටිනාකම ගිණුම් ගත කල යුතුය.

	මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුනද ඉඩම් අංශයෙන් ලද තොරතුරුවලට අනුව 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් එම වතුයාය නැවත පවරා ගැනිම හේතුවෙන් 2024 ජුනි 30 දිනට එම සමාගමට ගෙවිය යුතු මුදල රු.21,986,330 ක් වුවද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කර නොතිබුණි.	2009.12.22 වන විට අප විසින් නාගස්තැන්න වතුයායේ නැවත පවරා ගැනිම හේතුවෙන් Queenrich Agro සමාගමට ගෙවිය යුතු වූ මුදල රු.24,551,714 කි. එම එකගවීමෙන් අනතුරුව මණ්ඩලය විසින් රු.1,000,000 ක මුදලක් Queenrich Agro ආයතනය වෙත ගෙවීම් කර ඇති අතර, ඊට අමතරව, නාගස්තැන්න වතුයායේ තේ දළු තැරැව්කරුවන්ට විකිණීමෙන් ලද මුදල් ඔවුන් විසින් ලබාගෙන ඇති අතර, එම මුදල අඩුකල පසු ඔවුන් වෙත ගෙවිය යුතු මුළු මුදල රු. 21,986,330 කි. Queenrich Agro සමාගමේ 2024.06.24 දිනැති ලිපියෙන් ඔවුන් වෙත ලැබිය යුතු ශේෂය රු.21, 986,330 ක බව සනාථ කර ඇත. ඒ අනුව 2024.09.30 දිනට Queenrich Agro සමාගමේ ගිණුම නිවැරදි කර ඇත.	
(ඇ)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර 2010 වර්ෂයේදී අවසන් කර තිබුණු වතු සංවර්ධන ව්‍යාපෘතියට අදාලව සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733 ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම් ගත කර තිබුණි. මෙම මුදල් අයවීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුනද ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය 2010 දි අවසන් වී ඇති අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත තිබූ මෙම ව්‍යාපෘතිය සිදුකළ ආයතනය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට මෙම ශේෂය අයවිය යුතු වුවත්, එම ආයතනයද දැනට ක්‍රියාත්මක නොවන නොපවතින ආයතනයක් වන බැවින් මේ සම්බන්ධව තවදුරටත් කරුණු සොයා බැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.	මණ්ඩලයට මුදල් ප්‍රතිපූර්ණය කිරීමට පැවති ආයතනය දැනට ක්‍රියාත්මක නොවන නිසා ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය තුළ වූ වතු 17 කට අදාළව පවතින රු. 128,122,068 ක ශේෂයෙන් වතු 10 කට අදාල රු. 115,546,879 ක ශේෂයන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂනයක් සහ ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවීය. තවද වසර 10 කට වඩා පැරණි රු.7,287,138 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවති බව නිරික්ෂණය විය.	2020 වර්ෂයේ වතුවල ණය ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණ නියමිත ආකෘතියට අනුව නොතිබූ බව පිළිගන්නා අතර 2021 වර්ෂයේදි නියමිත ආකෘතියකට අනුව සියළුම වතුවල ණයහිමි, ණයගැති කාල විශ්ලේෂණ සටහන් සාදා නිමකර ඇත.	වතුවල ණය ශේෂයන්ට අදාළ ශේෂ සනාථ කර කඩිනමින් අයකර ගැනීමටත් අවිනිශ්චිත තත්ත්වයක පවතින ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදු කිරීමටත් කටයුතු කළ යුතුය.

(ඉ)	ණය හිමි උපලේඛනය අනුව වතුයායන් 9 ක වසර 05 ඉක්මවූ ණයහිමි ශේෂය රු.13,028,558 ක් හා වතුයායන් 4 ක වසර 10 ඉක්මවූ ණයහිමි ශේෂය රු.6,512,056 ක් පැවතුණද එම ණයහිමි ශේෂ නිරවුල් කිරීමට (හෝ හිමිකම්පෑමක් නොකරන ණයහිමියන් හඳුනාගෙන ආදායමට ගැනීමට) මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයන් පිළිබද තොරතුරු ලබාදීම සඳහා වතු අංශ දැනුවත් කර ඇති අතර මෙම ශේෂ පියවීමේ හැකියාව පිළිබද තොරතුරු සොයා බලන ලෙසද තව දුරටත් දැනුම් දෙන ලදී. වතුයායන් වෙතින් තොරතුරු දැනුම් දුන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇත.	වතුයායන් තුල පවතින ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය තුළ රු.3,418,944 ක යල්පැනගිය තේ තොගයක් පැවති අතර ඒ තුළ ඇතුළත් සමාලෝචිත වර්ෂයේ යල් පැන ගිය තේ තොගයේ වටිනාකම රු.1,049,491 ක් විය. මෙම යල් පැන ගිය තොග සඳහා අවශ්‍ය ගැලපීම් ගිණුම්වල සිදු කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධ තොග සමීක්ෂණ වාර්තාද විගණනයට ඉදිරිපත් නොවීය.	මෙම වටිනාකමෙහි ඇතුළත් රු.2,369,453 යනු 2019 වර්ෂයේ යල් පැන ගිය තේ තොගයේ වටිනාකම නොවන අතර, එය පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ශේෂයකි. පාරිභෝගික අංශය විසින් මෙම යල් පැන ගිය හා යල් පැනිමට ආසන්න තේ තොග නැවත භාවිතයට ගත හැකි තත්වයේ තොග බවට පත් කිරීම Refire ක්‍රියාවලියට ලක් කිරීම සඳහා වතු වෙත ආපසු යවන අතර එම ක්‍රියාවලියට ලක් කිරීමෙන් පසු නැවත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන අලෙවි කිරීම සිදුකරන ලබනු බව පාරිභෝගික අංශය විසින් දැනුම් දුන් නමුත් එම තොගයට අදාල මිල මෙම ගිණුමට ගැලපිම මෙතෙක් සිදුකර නොමැති අතර, එය 2024 වර්ෂයේදි නිවැරදි කිරීම කටයුතු කරනු ඇත.	නැවත භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර අලෙවි කිරීමට කටයුතු කර ඇත්නම් තොග ගිණුම තුළ අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු අතර පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ශේෂය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය	119,318,496	97,709,342	21,609,154	අප විසින් යවන ලද වාර්තාවට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අප ආයතන නමින් පවතින ලෙජර් ගිණුම් වල පිටපත් පමණක් අපවෙත ඒවා ඇති අතර, ප්‍රමාණවත් තොරතුරු නොමැති	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය පිළිබඳව නිවැරදි දත්ත රැස්කර නැවත අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

					බැවින් එම ගිණුම් හා සත්‍යාපනය කිරීම අපහසු වී ඇත.	
(ආ)	ගස් විකුණුම් ආදායම	47,606,468	47,158,339	448,129	මූල්‍ය ප්‍රකාශන හා උපලේඛනය අතර වෙනස රු.448,128 ක ශේෂය වන සම්පත් අංශය සමග සාකච්ඡා කර තොරතුරු ලබාගෙන නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.	ගස් විකුණුම් ආදායම පිළිබඳ සංසන්දනාත්මක වාර්තාවක් පිළියෙල කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කල යුතුය.
(ඇ)	වරිපනම් බදු වියදම	6,542,340	5,908,552	633,788	2020 ලාභ අලාභ ගිණුමේ පරිපාලන වියදමේ වරිපනම් බදු ලෙස පැවතිය යුතු ශේෂය රු.5,908,552 ක් වුව ද එය ලාභ අලාභ ගිණුම තුල රු.6,542,340 ක් ලෙස ලාභය රු.633,788 කින් අවප්‍රමාණය වී ඇත.	වරිපනම් බදු වියදම පිළිබඳ සංසන්දනාත්මක වාර්තාවක් පිළියෙල කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	වාර්ෂික ක්ෂය වියදම	33,487,549	30,666,760	2,820,789	ලෙජරය හා වත්කම් ලේඛනය අතර වෙනසට හේතුව වතුයායන්වල මාසිකව ක්ෂය ගණනය කිරිමේදි අඩුවෙන් හා වැඩියෙන් ගණනය කර තිබිම ලෙජරය තුළ නිවැරදි කිරිමයි. එනමුත් එම නිවැරදි කිරිම වත්කම් ලේඛනයේ සටහන් නොකිරිම මෙම වෙනසට හේතුවී ඇත.	මූල්‍ය ප්‍රකාශන හා වත්කම් ලේඛන නිවැරදිව සැසඳීම් කර නිවැරදි ක්ෂය වටිනාකම් ගිණුම් ගත කල යුතුය.

(ඉ)	දේපළ පිරියත හා උපකරණ වර්ග 05 ක පිරිවැය	349,237,039	343,648,415	5,588,624	Group II – රු.342, 258 ක් සහ Group I - රු.5,246,366 ක් වේ. ඒ අනුව Group II හි WIP එකට ඇතුලත් කර නොමැති බැවින් මෙම වෙනස ඇති වී ඇත. Group I හි වෙනස නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.	වත්කම් පිළිබඳ සංසන්දනාත්මක වාර්තාවක් පිළියෙල කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	ස්ථාවර වත්කම් ලේඛනයේ හදුනා නොගත් දේපල පිරියත උපකරණ ශේෂය	12,284,534	-	12,284,534	කළමනාකාරීත්වය විසින් මෙම ශේෂය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශණ ශේෂය හා ස්ථාවර වත්කම් ශේෂයන් සැසදීම් කර නිවැරදි ශේෂ හදුනා ගත යුතුය.
(උ)	ප්‍රධාන කාර්යාලයේ වෙළෙඳ ණය හිමි ශේෂය	142,786,753	142,966,115	179,362	ණයහිමි උපලේඛනයේ සදහන් දිගුකාලීන ණයහිමියන්ගේ ශේෂ වලින් බොහොමයක් ණයහිමි ශේෂ, කොටස් වශයෙන් ආයතනයේ පවතින මූල්‍ය තත්ත්වය අනුව ගෙවා ගෙන යමින් පවතිනු ඇත.	ණය හිමි ශේෂ තහවුරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුය.

1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අඛණ්ඩව අලාභ ලැබීම මත 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.මිලියන 924.8 ක හා රු.මිලියන 2,004.4 ක සෘණ අගයන් ගෙන තිබුණු අතර එදිනට පැහැර හරින ලද ව්‍යවස්ථාපිත ගෙවීම් රු.මිලියන 1,793.5 ක් වී තිබුණි.	මණ්ඩලය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට නොගැනිම හේතුවෙන් සෘණ අගයක් ගෙන ඇති අතර නැවත වත්කම් තක්සේරුවක් සිදුකල හොත් එම අගය ධනාත්මක	අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාව තක්සේරු කර එය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කල හැකි සැලසුම් සකස් කිරීම හා එය මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් හෙළිදරවු කිරීමට

සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 161.5 ක බැංකු ණය ශේෂයක්ද පියවීමට තිබුණි. මේ අනුව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බව තීරණය කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින දක්වාම එබඳු ප්‍රතිසංවිධානයක් සිදු කර නොතිබුණි.	අගයන් වනු ඇත. ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවය නිසා මෙහි සඳහන් ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට නොහැකි වී ඇති බවත් සඳහන් කරමු. 2020 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.4 මගින් දක්වා ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදුවූ දේශපාලනික වෙනස්කම් මත සිදු වී නොමැති බැවින් මෙම සටහන 2022 මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.	කටයුතු කල යුතුය.

1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම් සහ ගොඩනැඟිලි - ප්‍රධාන කාර්යාලය	1,503,744,550	ඉඩම්වල පිඹුරුපත් , සැලසුම්, තක්සේරු වාර්තා, පැවරීමට අදාල ගැසට් පත්‍ර, වත්කම් භෞතික සත්‍යාපන වාර්තා.	රු.1,503,744,550 හි ඇතුළත් රු.1,489,375,963 ක් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.	ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සහ ගොඩනැඟිලි අයිතිය හා පැවැත්ම සම්බන්ධව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කල යුතුය.
(ආ)	ස්ථාවර වත්කම් ශේෂය - ඕනුගල්ඔය වතුයාය	6,013,927	ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් භෞතික වත්කම් සත්‍යාපන වාර්තා	ඕනුගල් ඔය වත්ත මහවැලි ව්‍යාපෘතිය සඳහා මහවැලි අධිකාරිය විසින් පවරා ගත් ඉඩමක් වන අතර, එය මහවැලි ව්‍යාපෘතිය නිසා යටවීම හේතුවෙන් ඊට අදාළ ස්ථාවර වත්කම්වලද භෞතික පැවැත්මක් නොමැත. ඉඩම් අංශයෙන් ලබාදුන් ලිපියක පිටපතට අනුව ඕනුගල් ඔය වත්ත මහවැලි ව්‍යාපෘතියට ලබාගත් බවට තොරතුරු දැක්වෙන තව දුරටත් කරුණු සොයා ගැනීමෙන් අනතුරුව වත්කම්	වත්කම් අයිතිය හා පැවැත්ම තහවුරු කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.

				වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.	
(ඇ)	වෙනත් වත්කම්	8,696,304	ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, වත්කම් භෞතික සත්‍යාපන වාර්තා	රු.8,696,304 ක අගය සම්බන්ධ කිසිදු තොරතුරක් මේ වන විට ආයතනය සතුව නොපවතිනු ඇත.	වෙනත් වත්කම්වලට අදාල ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය.
(ඈ)	ජීව විද්‍යාත්මක වත්කම් - පරිනත වගාව	17,925,652	ගස් සංගණන වාර්තා , වටිනාකම තක්සේරු කිරීමට අදාල වාර්තා	මෙම ජීව විද්‍යාත්මක වත්කම් රු.17,925,652 ක් 1996 වර්ෂයට පෙර සිට දිගුකාලීනව පවතින ශේෂයන් වන බැවින් මේ සම්බන්ධ තොරතුරු සොයා ගැනිමට ආයතන සතුව ලිපිගොනු නොපවතිනු ඇත.	ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කර ඇති ශේෂයන් හඳුනාගැනීමට කටයුතු කල යුතුය.
(ඉ)	කෙරීගෙන යන වැඩ	34,244,271	වැඩ අනුමත කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, ගෙවීම් වවුචර්, නිම කළ වැඩ කොටස් වල කාර්යයසාධන ඇගයීම් වාර්තා	මේ සම්බන්ධව සියළු තොරතුරු වතුයායන්වල පවතින බැවින් විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරිම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වනු ඇත.	කෙරීගෙන යන වැඩ ශේෂ තහවුරු කිරීමට අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් යුතුය.
(ඊ)	ආපසු ගෙවිය යුතු තැන්පතු	68,859,348	විස්තරාත්මක උපලේඛන,කාල විශ්ලේෂණ	ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධව උපලේඛනය ආයතනය සතුව දැනට නොපවතින අතර 2024 වර්ෂයේ සිට එම උපලේඛණය පවත්වාගෙන යාමට කටයුතු කරමි. අදාළ කාර්යයන් අවසන් වීමෙන් පසු තැන්පත්කරුවන්ගේ ඉල්ලීම මත, මෙම මුදල් නැවත තැන්පත්කරුවන් වෙත ලබාදිම සිදුකරනු ඇත.	තැන්පතු ශේෂ හඳුනා ගැනීමට නොහැකි නම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව අවශ්‍ය කටයුතු කල යුතුය.

(උ)	තේ දළු විකුණුම් ආදායම	25,492,128	විකුණුම් සම්බන්ධ විස්තර සහ ශේෂ සනාථන	හැටන් ප්ලාන්ටේෂන් ආයතනයෙන් හා ඉන්සයිට් ෆ්‍රැක්ට්‍රීස් පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු තේ දළු විකුණුම් ආදායම සඳහා අදාල කාල විශ්ලේෂණයක් පමණක් රජයේ විගණනය විසින් ඉල්ලුම් කල අවස්ථාවේදි ගිණුම් අංශය විසින් සපයා ඇති අතර ඒ අනුව මෙම ශේෂයන් 2021.01.08 වන දින පියවා ඇත.	තේ දළු විකුණුම් ආදායම සම්බන්ධ විස්තර සහ ශේෂ සනාථන මගින් ලැබිය යුතු ආදායම හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	අවසාන තොගය - පැළ තවාන්	11,010,075	භාණ්ඩ සමීක්ෂණ වාර්තා, විස්තරාත්මක උපලේඛන හා තවාන් පිළිබඳ වාර්තා	තවාන් පිළිබඳ වාර්තා වතුයායන් වලින් ලබා ගත යුතු වුවද මේ සඳහා ලබාදී ඇති කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදි එම වාර්තා ලබාදිමට කටයුතු කරනු ඇත.	අවසාන තොගය තුළ ඇතුළත් මෙම පැළ තවාන් ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය වාර්ථා වතු යායන් වලින් ලබා ගෙන ශේෂ තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	වෙළෙඳ හා අනිකුත් ලැබිය යුතු දෑ - ගැලපුම් ශේෂය	30,563,313	ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන	කාලයක් සිට පැවැත එන ශේෂ අදාළ ගිණුම් වලින් ඉවත්කර ලියා හැරීම සඳහා මෙම ගිණුම වෙත මාරු කර ඇති නමුත් මෙම ශේෂ සඳහා ප්‍රමාණවත් තොරතුරු ආයතනය සතුව නැත.	ණයගැති කාල විශ්ලේෂයක් හා විස්තරාත්මක උපලේඛණ සකස්කර අවශ්‍ය අය කිරීම් කිරීමට හා අයකර ගත නොහැකි ශේෂ සඳහා මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදනයන් සිදුකල යුතුය.

(ඒ)	විවිධ ණයගැතියන් -ප්‍රධාන කාර්යාලය	4,114,051	විස්තරාත්මක උපලේඛන	2020 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන වල විස්තරාත්මක සටහන් යටතේ දක්වා ඇත. මින් 1,152,879 - Jaffna Area Control ගිණුම වතු ගිණුම් වල පවතින Jaffna Area Control තුලනය වී ශේෂයක් ඉතිරි නොවන අතර - 89,752,740 -Jana Tea Control ගිණුම වන අතර මෙය ජන තේ අංශයේ ප්‍රධාන කාර්යාල ගිණුම හා තුලනය වේ.මෙම ගිණුමෙහි ඇති ශේෂය රු.9,779 ගිණුම් දෝෂයක් වන අතර මෙය සත්‍යාපනය කර නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ණයගැති ශේෂ හදුනාගෙන ඒවා අයකරගැනීමට කටයුතු කලයුතු අතර ශේෂ සනාථ කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කල යුතුය. තවද අයකර ගැනීමට නොහැකි ණය ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රතිපාදනයන් ඇතිකල යුතුය.
(ඔ)	මොන්තක්‍රිස්ටෝ වතුයාය බදු දීමෙන් ලැබිය යුතු ශේෂය (වර්ෂ 19 කට වැඩි)	40,503,226	ශේෂ සනාථන	මොන්ත ක්‍රිස්ටෝ වතුයාය පෞද්ගලික අංශය වෙත බදු දිමේදි එම වතුයායේ තිබූ වත්කම් හා වගකීම් ඇතුලත් පාලන ගිණුම මෙය වන අතර, මෙම ගිණුම තුළ ඇතුලත් ශේෂය සතේක්ෂණය කිරිමට ඉදිරියේදි කටයුතු කරනු ඇත.	මොන්ත ක්‍රිස්ටෝ වතුයාය බදු දීමෙන් ලැබිය යුතු ශේෂය හදුනාගැනීමට හා සැසදීම් සිදුකර ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.7 අවිනිශ්චිත ගිණුම්

විෂය	**මුදල රු.**	**අවිනිශ්චිත ලෙස තිබූ කාලය**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් අවිනිශ්චිත ගිණුම් ශේෂ	6,206,317	වසර 24ක පමණ කාලයක්	රු.4,342,561 ක් වූ මෙම වතු වලට අයත් ශේෂය හා රු.1,863,756 ක ප්‍රධාන කාර්යාලයේ අවිනිශ්චිත ගිණුමේ ශේෂය 1996 වර්ෂයට පෙර සිට පැවැත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනිමට නොහැකි වී ඇත.	අවිනිශ්චිත ගිණුම් ශේෂ හදුනාගැනීමට හා හදුනාගැනීමට නොහැකි ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය\
මණ්ඩලයේ තේ දළු විකිණීම සඳහා ලියාපදිංචි ගැණුම්කරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව දින 15ක ණය කාල සීමාවක් ඇතුළත ලැබිය යුතු මුදල් අය කරගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට වසර 7ක් දක්වා කාල පරාසයන් ඉක්මවූ එම ණයගැති ශේෂය රු.40,270,672 ක් වී තිබුණි.	තේ දළු විකිණීම සම්බන්ධයෙන් ලැබිය යුතු ශේෂ වලින් දැනට ගැණුම්කරුවන් කිහිපදෙනෙකුගෙන් මුදල් අයවී ඇත.	ලැබිය යුතු ශේෂ නියමිත දිනට අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග හා අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පවතින ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් සිදු කිරීමටද කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙළෙඳ ණයහිමි කාල විශ්ලේෂණය අනුව වසර 1 සිට 3 දක්වා වූ ශේෂය රු.7,758,060 ක් ද වසර 3 සිට 6 දක්වා වූ ශේෂය රු.12,821,559 ක් ද වසර 06 ඉක්මවූ ශේෂය රු.92,162,860 ක් ද නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නොතිබුණි.	ණයහිමි උපලේඛනයේ සඳහන් දිගුකාලීන ණයහිමියන්ගේ ශේෂ වලින් බොහෝමයක් ණයහිමි ශේෂ, කොටස් වශයෙන් ආයතනයේ පවතින මූල්‍ය තත්ත්වය අනුව ගෙවා ගෙන යමින් පවතිනු ඇත.	මෙම ණයහිමි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ 5 (1) උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් රු.569,200,642 ක පාරිතෝෂික ගෙවා නොතිබුණි. තවද පාරිතෝෂික වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරින්නාවූ යම් සේවා	දිගින් දිගටම ආයතනයේ පවතින කාරක ප්‍රාග්ධන මූල්‍ය දූෂ්කරතා නිසා ආයතනයේ සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීම සිදු කිරිමට නොහැකි වී තිබූ අතර වර්තමානය වන විට නඩු දැමූ සේවකයන්ට එම නඩු වලට අනුකූලව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව	පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික නියමිත කාලයේදී ගෙවීමට කටයුතු කිරීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

		යෝජකයකු එම මුදලට අතිරේකව පනතේ වගන්ති අනුව ගණනය කර, අධිභාර ගෙවිය යුතු බැවින් මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලය විසින් 2020 වර්ෂය අවසානයට රු.171,623,502 ක මුදලක් අධිභාර ලෙස ද ගෙවිය යුතුව තිබුණි.	ලැබෙන රු.මිලියන 30 ක මුදලින් හා වර්තමානයේ පවතින මුදල් ප්‍රවාහය අනුව සේවකයන් ඉවත්ව ගිය හා යන අනුපිළිවෙලට පාරිතෝෂික මුදල් ගෙවීම් සිදුකරමින් පවතිනු ඇත.	
(ආ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	සේවා යෝජකයා විසින්, සේවක අර්ථ සාධක දායක මුදලේ සේවකයාගේ කොටස එම සේවකයාගේ ඉපයීම් වලින් අඩු කොට ඊළඟ මාසයෙහි අන්තිම දිනයට පෙර අරමුදලට ගෙවිය යුතු අතර සේවායෝජකයාගේ දායක මුදලද ඒ අනුව ගෙවිය යුතු වුවද මණ්ඩලය එලෙස 2001 වර්ෂයේ සිට වසර 19 කට ආසන්න කාලයක් සඳහා ගෙවිය යුතු අර්ථසාධක ලෙස රු.860,521,811 ක් ද ගෙවිය යුතු වතු කාර්ය මණ්ඩල අර්ථසාධක (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක (CPPS) රු.98,883,502 ක් ද පැවතුණු අතර 2020 වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.28,990,507 ක අධිභාර ද ගෙවීම් කර නොතිබුණි.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETFදිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබු අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සඳහා ලබා දෙමින් පවතී. එමගින් හිඟ ව්‍යවස්ථාපිත දීමනානැවත ගෙවීම් සිදුකරගෙන යමින් පවතී. තවද 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජුලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකූලව ගෙවීම් කරමින් පවතිනු ඇත.	සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව අර්ථසාධක අරමුදල් වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය	සේවා යෝජක විසින් ඒ සේවා නියුක්තයා තම සේවයෙහි නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන්, සේවා නියුක්තයා උපයන මුළු ඉපයීම්වලින් සියයට තුනකට පමණ වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීම් කළ යුතු වුවද මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සිට වසර 9 කට ආසන්න කාලයක් සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.63,838,198 ක ගෙවීම් පැහැර හැර තිබුණු අතර 2020 වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.407,089 ක අධිභාර ද ගෙවිය යුතුව තිබුණි.	-එම-	සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු වාරික නියමිත පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය	සෑම තක්සේරු වර්ෂයක්ම අවසන් වීමෙන් පසුව මාස 08 කට නොඅඩු කාලයක් තුළ එම තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු වූවත් මණ්ඩලය විසින් 2020/2021 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තාව ලබා දී තිබුණේ 2024.02.11 දිනදීය.	දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂය තෙක් ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර ඇති අතර, මෙම ආයතනය දිගින් දිගටම පාඩු ලබන ආයතනයක් වන බැවින් වර්ෂයට අදාළව ගෙවිය යුතු ආදායම් බදු අගයක් නොමැති බවද වාර්තාවල දක්වා ඇත. 2020/2021 ආදායම් වාර්තාව මාර්ගගත ක්‍රමය ඔස්සේ ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත.	දේශීය ආදායම් බදු පනතේ වගන්ති ප්‍රකාරව තක්සේරු වර්ෂයට අදාල ආදායම් ඇතුලත් බදු වාර්තාව නියමිත පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති	මූල්‍ය වර්ෂයක් අවසාන් වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයේ වාර්ෂික ගිණුම් හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද,	අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මත විගණනය කර ගිණුම් සෑදිම සඳහා පුද්ගලික සමාගමකට ලබාදීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව අස්ථිත්වයේ වාර්ෂික ගිණුම් හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව

	අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2021,2022,2023 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ලබා දී නොතිබුණු අතර 2020 වර්ෂයේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 අගෝස්තු 08 දින වන අතර එම වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින දක්වා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වර්ෂ 02කට වඩා අධික කාලයක් ප්‍රමාදයක් සිදුවී තිබූ නමුත් අප විසින් දැනට 2023 වර්ෂය දක්වා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන සකස් කර අධ්‍යක්ෂක මණ්ඩලය වෙත හා රජයේ විගණනය වෙත 2024.08.08 ඉදිරිපත් කර ඇත.	විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 11.1 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මු.රෙ. 756(6)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ලබාදිය වුවත්, 2020 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ලබා දී තිබුණේ 2024 අගෝස්තු 08 දිනදීය.	2020, 2021, 2022 හා 2023 යන වර්ෂවලට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා සියල්ල මණ්ඩලය සතු වන අතර මෙතෙක් රජයේ විගණනය වෙත විගණනය සිදුකරන වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදී ඇත. 2021, 2022 හා 2023 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා රජයේ විගණනය වෙත 2024 ඔක්තෝබර් යොමු කිරිමට කටයුතු කරන අතර 2024 වර්ෂයේ සිට නියමිත කාල පරිච්ඡේදය තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදිමට කරනු ඇත.	චක්‍රලේඛනය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත නියමිත කාලය තුලදී ඉදිරිපත් කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 348,392,616 ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 757,593,788 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 409,201,172 කින් සමස්ථ අලාභයේ ධනාත්මක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අලාභයේ ධනාත්මක අඩුවීමට මණ්ඩලයේ ප්‍රධාන ආදායම් රු.242,927,543 කින් වැඩිවීමත් තේ සහ රබර් වගාවන්ට අදාල විකුණුම් පිරිවැය සමස්ථයක් ලෙස රු.130,403,650 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 4.8 කින් අඩුවී ඇති අතර රබර් හා වෙනත් බෝගවලින් ලැබෙන ආදායම් 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 45 ක් අඩුවී තිබුණි. 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ තේ දළු හා පාරිභෝජ්‍ය තේ වගාවට අදාළ පිරිවැය පිළිවෙලින් සියයට 177 කින් හා සියයට 22 කින් වැඩිවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය සමාන තත්වයේ වූ අතර එය 1:0.32 ක් හා 1:0.29 විය.

- සමාලෝචිත වර්ෂයේ දළ අලාභ අනුපාතය සියයට 24ක් වූ අතර, පසුගිය වර්ෂයේ දි එම අනුපාතය සියයට 72 ක් විය.

- සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 34ක් වූ අතර පසුගිය වර්ෂයේ දී එම අනුපාතය සියයට 88ක් විය.

මණ්ඩලයේ 2020 හා 2019 වර්ෂයන්හි අනුපාත පරීක්ෂාවේදී පවතින ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් දළ හා ශුද්ධ අලාභ තත්ත්වය දිගින් දිගටම පැවතීමත් හා ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය ඉක්මවූ ණය ප්‍රාග්ධනයක් පැවතීමත් තුළින් ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හා අඛණ්ඩ පැවැත්මේ අවධානම පිළිබඳ විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන් විසින් උපයන ලද වෙනත් ආදායම් හැර ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන තේ දලු විකුණුම් ආදායම, නිෂ්පාදිත තේ විකුණුම් ආදායම,වතුයාය තුළ තේ විකුණුම් ආදායම සහ රබර් කිරි විකිණීමෙන් උපයන ලද වාර්ෂික ආදායම රු.703,920,345 ක් වූ අතර ලෙජර් ගිණුම් අනුව විකුණුම් පිරිවැය තුළ ඇතුළත් ප්‍රධාන පිරිවැය මූලාශ්‍ර වන පොදු වියදම්, ක්ෂේත්‍රයේ කටයුතු සඳහා වන වියදම් සහ නිෂ්පාදනය සඳහා දරන ලද වියදම්හී එකතුව රු.1,055,242,384 ක් වූ බැවින් දියලුම වතුයාය හැර වතුයායන් 16 කටම මෙම ප්‍රධාන වියදම් ඉක්මවා ආදායම් උපයා ගැනීමට නොහැකිවී තිබුණි.	එකගවෙමි.	එක් එක් වතුයායන්ට අදාලව ආදායම් වැඩි කිරීමේ ක්‍රියාකරී සැලසුම් සකස් කිරීමටත් මනා සුපරීක්ෂණයක් යටතේ වියදම් පාලනයට කටයුතු කරමින් එම ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායීව ලගා කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ හා වතුයායන් වල ආදායමෙන් සියයට 0.25 ක් බැර කර විධිමත් අනුමැතියකින් තොරව "සභාපති සුභසාධක අරමුදල" නමින් අරමුදලක් 2020 වර්ෂයේදී පිහිටුවා සමාලෝචිත වර්ෂයේදී අරමුදල වෙත රු.2,475,672 ක් බැරකර තිබුණි	සභාපති සුභසාධක අරමුදල පිහිටුවීමට අදාළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවට අදාළ ගිණුම් අංශයට ලැබී ඇති අනුමැතිය විගණන අංශය වෙත ගිණුම් අංශය මගින් ලබා දී ඇත.	සභාපති සුභසාධක අරමුදල සඳහා භාණ්ඩාගාරයේ අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.